සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

විභාග අංකයඃ ....

ව්‍යාපාර අධ්‍යයනය - I

කාලය පැය 02 යි

උපදෙස්:-

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරුඅදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති තිත් ඉර මත පැහැදිලි ව සටහන් කරන්න.

ප්‍රශ්න අංකය	ලකුණු
01 - 30	
31 - 50	
එකතුව	

---

(01) වාණිජ්‍යය යනු,

(1) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්බන්ධ වන ඕනෑම තත්ත්වයකි.
(2) වෙළෙඳාමට අයත් සෑම ක්‍රියාකාරකමක්ම ය.
(3) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා ඇති ඕනෑම ආර්ථික කටයුත්තකි.
(4) නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්‍ෂ සිදුවන භාණ්ඩ හා සේවා හුවමාරුවට අදාළ සමස්ත ක්‍රියාවලිය යි.
(5) කර්මාන්ත හා වෙළෙඳාමට අදාළ සමස්ත ක්‍රියාවලිය යි. (......)

(02) "ඇන්ටිජන්" පරීක්ෂණ කට්ටල ශ්‍රී ලංකාව තුළ නිපදවීමට දේශීය සමාගමක් පියවර ගෙන තිබේ. ව්‍යාපාර වර්ගීකරණය අනුව එම ව්‍යාපාර කටයුත්ත අයත් වන්නේ මින් කුමන වර්ගයට ද?

(1) ප්‍රාථමික (2) ද්විතීක (3) තෘතීයික (4) පොදු (5) සේවා (......)

(03) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට අද දක්වා මුදල් භාවිතයේ ඇති වූ ක්‍රමික විකාශනයේ අවස්ථා පහත දැක්වේ.

A - ලෝහ වර්ග භාවිතය
B - ද්‍රව්‍ය භාවිතය
C - ලෝහ කාසි භාවිතය
D - බැංකු මුදල් භාණ්ඩ
E - විද්‍යුත් මුදල් භාවිතය
F - කාසි හා නෝට්ටු භාවිතය

ඉහත සඳහන් අවස්ථා නිවැරදි අනු පිළිවෙළට පෙළ ගස්වා ඇති වරණය වන්නේ,

(1) B, C, A, F, D, E (2) B, A, F, C, D, E (3) B, C, A, D, F, E
(4) B, A, C, D, F, E (5) B, A, C, F, D, E (......)

(04) ව්‍යාපාර කාර්යයන් හා ඇගලුම් කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් ඊට අදාළ නිදසුන් කිහිපයක් පහත වගුවේ දැක්වේ.

ව්‍යාපාර කාර්යයන්	නිදසුන්
(1) අලෙවිකරණය	A - සේවක ලිපිගොනු සැකසීම.
(2) පරිපාලනය	B - අමුද්‍රව්‍ය මිල දී ගැනීම.
(3) නිෂ්පාදනය	C - මැසීමේ අංශය නවීකරණය කිරීම.
(4) මූල්‍ය	D - ඇගලුම් බෙදාහැරීම.
(5) පර්යේෂණ හා සංවර්ධනය	E - වඩාත් සුරක්ෂිත මුව ආවරණ පෙළක් නිර්මාණය කිරීම.

ඉහත දී ඇති ව්‍යාපාර කාර්යයන් හා ඒවාට සුදුසු නිදසුන් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) D, B, A, C, E (2) D, A, B, C, E (3) B, D, E, A, C
(4) B, A, D, C, E (5) E, A, D, B, C (......)

(05) ව්‍යාපාරයක් විසින් තම තරඟකරුවන් සැලකිල්ලට ගනිමින් ගොඩනගා ඇති ආචාර ධර්මයක් වන්නේ,

(1) සියලු සේවකයින්ට සමාන ව සැලකීම යි.
(2) ප්‍රචාරණයේ දී අන් ව්‍යාපාරික ප්‍රතිරූපවලට හානි නොකිරීම යි.
(3) ආගමික සංකේත ව්‍යාපාර කටයුතු වලට යොදා නොගැනීම යි.
(4) ඉහළ ගුණාත්මයෙන් යුතු භාණ්ඩ නිපදවීම ය.
(5) වැඩිහිටියන්ට ආචාරශීලී වීම යි. (......)

(06) රජයේ අරමුණු ඉටු කිරීමට ව්‍යාපාරයක් දායක වන්නේ,

(1) පරිසරයට වන හානිය අවම කිරීමෙ නි. (2) පූර්ණ සේවා නියුක්තිය ඇති කිරීමෙ නි.
(3) පාරිභෝගික ආරක්ෂණය සහතික කිරීමෙ නි. (4) ආර්ථික ස්ථායිතාව ඇති කිරීමෙ නි.
(5) වෙළෙඳ පොළ තුළ තරඟ කාරිත්වයක් පවත්වා ගැනීමෙ නි. (......)

(07) ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සඳහා වූ අන්තර්ජාතික ප්‍රමිතිය වන්නේ,

(1) ISO 9001 (2) ISO 14001 (3) ISO 22000
(4) ISO 27000 (5) ISO 51000 (......)

(08) ශ්‍රී ලංකාවේ බදු වර්ග කීපයක් පහත දැක්වේ.

A - සමාගම් බදු B - ජාතිය ගොඩනැගීමේ බද්ධ
C - VAT බද්ධ D - රේගු බද්ධ F - ප්‍රාග්ධන ලාභ බද්ධ

ඉහත බදු අතුරෙන් සෘජු බදු වර්ග පමණක් අඩංගු වරණය වන්නේ,

(1) A, B, C (2) A, B, F (3) B, E, F (4) C, D, E (5) D, E, F (......)

(09) හවුල් ව්‍යාපාර ක්‍රමයේ වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.

A - අලාභ හවුල්කරුවන් අතර බෙදී යාම. B - වගකීම අසීමිත වීම.
C - ආරම්භ කිරීමට පහසු වීම. D - විවිධ කුසලතා ඇති පිරිස් එකතු වීම.
E - නෛතික පුද්ගලභාවයක් නොමැති වීම. F - ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම.
G - වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.

ඉහත කරුණු අතරෙන් හවුල් ව්‍යාපාර ක්‍රමයේ වාසි හා අවාසි දැක්වෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,

	වාසි	අවාසි
(1)	A, B, D, G	B, E, F
(2)	A, B, D, G	C, E, F
(3)	B, C, D, E	A, F, G
(4)	A, C, F, G	B, D, F
(5)	B, D, E, G	A, C, F

(......)

(10) පහත දැක්වෙන්නේ සංස්ථාපිත සමාගම් වලට අදාළ ලක්ෂණ කිහිපයකි.

A - කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකියි.
B - උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව 50 කි.
C - කොටස් හා ණයකර නිකුත් කර ප්‍රාග්ධනය සපයා ගත හැකියි.
D - අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව 01 කි.
E - කොටස් කරුවන් ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළයුතු වීම.

පොදු සමාගම් හා පෞද්ගලික සමාගම් වලට අදාළ ව වෙන වෙන ම ලක්ෂණ දැක්වෙන නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.

	පොදු සමාගම් වල ලක්ෂණ	පෞද්ගලික සමාගම්වල ලක්ෂණ
(1)	A, C හා E	B හා D
(2)	A, B හා C	D හා E
(3)	A, B හා D	C හා E
(4)	B,C හා D	A හා E
(5)	B, D හා E	A හා C

(......)

(11) පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධානවල පවතින විවිධ ලක්ෂණ කිහිපයකි.

A - ලාභ තනිව භුක්ති විඳීම.
B - වගකීම අසීමිතවන අතර කිහිප දෙනෙකු අතර එය බෙදී යාම.
C - සාමූහික ව තීරණ ගැනීමෙන් සාර්ථකත්වයට පැමිණීම.
D - ලාභාලාභ කිහිප දෙනෙකු අතර බෙදීයාම.
E - නෛතික පුද්ගලභාවයක් පැවතීම.
F - සාමාජිකයින් 2 ත් 20 ත් අතර ප්‍රමාණයක් සිටීම.

ඉහත ලක්ෂණ අතරෙන් හවුල් ව්‍යාපාරයකට අදාළ ලක්ෂණ වන්නේ,

(1) B, C, D, E (2) B, D, E, F (3) A, B, C, D (4) C, D, E, F (5) B, C, D, F (......)

(12) පහත සඳහන් වන්නේ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි කිහිපයකි.

A - ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය.
B - සාංගමික ව්‍යවස්ථාවලිය.
C - අතුරු ව්‍යාවස්ථාවලියේ පිටපත් දෙකක්.
D - ලියාපදිංචිය සඳහා සම්මත වූ මහා සභා රැස්වීමේ වාර්තාවක්.
E - යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්.
F - ව්‍යවස්ථානුකූල ප්‍රකාශය.

ඉහත ලියවිලි අතරෙන් සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි වන්නේ,

(1) A, B, C, D (2) A, C, D, E (3) A, D, E, F (4) B, C, D, E (5) C, D, E, F (......)

(13) ව්‍යවසායකත්ව ප්‍රවණතාව හා සිද්ධි කිහිපයක් පහතින් දැක්වේ.

ව්‍යවසායකත්ව ප්‍රවණතාව	සිද්ධිය
01 ගෝලීය ව්‍යවසායකත්වය	A - රොටරි සමාජයෙන් විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට ළමුන්ට ඉගෙනුම් මධ්‍යස්ථාන අරඹයි.
02 හරිත ව්‍යවසායකත්වය	B - ඩීල් දුරකථන සමාගමේ සේවකයෙකු නවීන පහසුකම් සහිත දුරකථනයක් නිර්මාණය කර ව්‍යාපාරයේ අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරයි.
03 අභ්‍යන්තර ව්‍යවසායකත්වය	C - ස්ටාර් දුරකථන සමාගම නෙට් දුරකථන සමගම හා ඒකාබද්ධව නවතම කථන පහසුකම් වලින් සමන්විත අන්තර්ජාල සේවා සපයයි.
04 සමාජ ව්‍යවසායකත්වය	D - නිර්මාණී සමාගම කඩදාසි රහිත කාර්යාල ක්‍රමයක් හඳුන්වා දෙයි.

ව්‍යවසායකත්ව ප්‍රවණතාවට වඩාත් ගැළපෙන සිද්ධිය දැක්වෙන අනුපිළිවෙල සහිත පිළිතුර තෝරන්න.

(1) C, B, A, D (2) C, D, B, A (3) C, A, D, B (4) C, B, D, A (5) C, D, A, B (......)

(14) ව්‍යවසායකත්ව ක්‍රියාවලියෙහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරු තෝරන්න.

(1) සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම ⟶ අවශ්‍ය සම්පත් සම්පාදනය ⟶ ප්‍රතිලාභ ලැබීම ⟶ නව්‍යතා සොයා ගැනීම ⟶ යථාර්ථයක් බවට පත් කර ගැනීම.

(2) අවශ්‍ය සම්පත් සම්පාදනය ⟶ නව්‍යතා සොයා ගැනීම ⟶ සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම. ⟶ යථාර්ථයක් බවට පත් කර ගැනීම. ⟶ ප්‍රතිලාභ ලැබීම.

(3) නව්‍යතා සොයා ගැනීම ⟶ සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම. ⟶ අවශ්‍ය සම්පත් සම්පාදනය ⟶ යථාර්ථයක් බවට පත් කර ගැනීම. ⟶ ප්‍රතිලාභ ලැබීම.

(4) නව්‍යතා සොයා ගැනීම ⟶ අවශ්‍ය සම්පත් සම්පාදනය ⟶ ප්‍රතිලාභ ලැබීම ⟶ සංකල්ප ගොඩ නැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම ⟶ යථාර්ථයක් බවට පත් කර ගැනීම.

(5) සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම ⟶ ප්‍රතිලාභ ලැබීම ⟶ නව්‍යතා සොයා ගැනීම ⟶ අවශ්‍ය සම්පත් සම්පාදනය ⟶ යථාර්ථයක් බවට පත් කර ගැනීම. (......)

(15) සුළු හා මධ්‍ය පරිමාණ ආයතන හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විවිධ නිර්ණායක භාවිත කෙරේ. එවැනි ආයතන කිහිපයක් A තීරුවේ ද භාවිතයට ගන්නා නිර්ණායක කිහිපයක් B තීරුවේ ද පහතින් දැක්වේ.

A	B
1. ශ්‍රී ලංකා මහ බැංකුව	සේවක සංඛ්‍යාව
2. කාර්මික තාක්‍ෂණික ආයතනය	විදුලි භාවිතය
3. ජන ලේඛන හා සංඛ්‍යා දෙපාර්තමේන්තුව	ප්‍රාග්ධනය

A තීරුවේ දැක්වෙන ආයතන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීමට යොදා ගන්නා B තීරුවේ දැක්වෙන නිර්ණායක අනුපිළිවෙලට සඳහන් පිළිතුර වන්නේ,

(1) ප්‍රාග්ධනය / විදුලි භාවිතය / සේවක සංඛ්‍යාව
(2) විදුලි භාවිතය / සේවක සංඛ්‍යාව / ප්‍රාග්ධනය
(3) සේවක සංඛ්‍යාව / විදුලි භාවිතය / ප්‍රාග්ධනය
(4) විදුලි භාවිතය / ප්‍රාග්ධනය / සේවක සංඛ්‍යාව
(5) ප්‍රාග්ධනය / සේවක සංඛ්‍යාව / විදුලි භාවිතය (......)

(16) A ඉතිරි කිරීමේ ගිණුම් වල ශේෂ B ජංගම ගිණුම් වල ශේෂ C කාසි හා නෝට්ටු D ජයපත් හා තැන්පත් E ස්ථාවර තැන්පතු ශේෂ

ඉහත සඳහන් මුදල් වර්ග වලින් ආසන්න මුදල් ලෙස පිළිගත හැක්කේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A හා E පමණි.
(4) B හා D පමණි. (5) C හා E පමණි. (......)

(17) පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන වර්ග කිහිපයකි.

A - බලපත්‍ර ලාභී මුදල් සමාගම් B - කල්බදු සමාගම්
C - රක්‍ෂණ සමාගම් D - ඒකක භාර සහ ඒකක භාර කලමණාකරණ සමාගම්
E - ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් F - බලපත්‍රලාභී විශේෂ බැංකු

මේවා අතුරින් විශේෂිත මූල්‍ය සමාගම් වන්නේ,

(1) A, B සහ D ය. (2) B, E සහ F ය. (3) B, D සහ E ය.
(4) B, E සහ C ය. (5) C, E සහ C ය. (......)

(18) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු සහ කාර්යයන් කිහිපයක් පහත දැක් වේ.

A - ආර්ථික හා මිල ස්ථායිතාවය පවත්වාගෙන යාම.
B - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම.
C - විනිමය අනුපාත ප්‍රතිපත්ති මෙහෙය වීම.
D - මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය පවත්වා ගැනීම.
D - මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය පවත්වා ගැනීම.
E - මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම.

ඉහත සඳහන් දෑ අතුරින් ශ්‍රී ලංක මහ බැංකුවේ කාර්යයන් ඇතුලත් පිළිතුර වනුයේ,

(1) A, B, C (2) A, C, A (3) B, C, E
(4) A, D, E (5) B, C, D (......)

(19) නුවන් සිය ව්‍යාපාරික ගොඩනැගිල්ල සඳහා A නැමැති රක්ෂණ සමාගමෙන් රු. 200 000 ක රක්ෂණ ඔප්පුවක් ද B නමැති රක්ෂණ සමාගමෙන් රු. 400 000 රක්ෂණ ඔප්පුවක් ද ලබාගෙන තිබුණි. මෙම ගොඩනැගිල්ලට ගින්නකින් රු. 300 000 ක අලාභයක් සිදු වුණි. A හා B කෝණ සමාගම් වලින් ගොඩනැගිල්ල සඳහා ගෙවනු ලබන අලාභය කොපමණ ද?

(1) A සමාගම 200 000 B සමාගම 100 000 (2) A සමාගම 200 000 B සමාගම 400 000

(3) A සමාගම 200 000 B සමාගම 3000 000 (4) A සමාගම 15 000 B සමාගම 150 000

(5) A සමාගම 100 000 B සමාගම 200 000 (......)

(20) රක්ෂණ ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා තිබිය යුතු මූලිකාංගයන් නොවන්නේ,

(1) ප්‍රතිග්‍රහණය (2) නීතියට එකඟ බව (3) අර්පණය

(4) සත්‍යාපනය (5) නෛතික බැඳීමක් ඇති කර ගැනීම. (......)

(21) අභ්‍යන්තර සන්නිවේදන මාර්ගයක් වන මෙමෝ පත්‍රය මගින් සිදු කරනු ලබන කාර්ය වන්නේ,

(1) ව්‍යාපාරයේ එක් අංශයක ප්‍රධානියකු විසින් තවත් අංශයක ප්‍රධානියකුට රැස්වීමක් සඳහා ආරාධනා කරනු ලබන ලේඛණයකි.

(2) මාසික වැටුප් අත්තිකාරම් ලබා ගැනීම සඳහා වෙනත් අංශයකින් මුදල් අංශය වෙත කරනු ලබන ඉල්ලීමකි.

(3) ආයතනයේ ප්‍රධානියා විසින් වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන බව දක්වමින් සියළු අධ්‍යක්ෂකවරුන් වෙත දන්වා යවනු ලබන සිහි කැඳවීමකි.

(4) ආයතනයේ විධායක නිළධාරියෙකු විසින්, තවත් පාර්ශවයකට සුවිශේෂී කෙටි පණිවිඩයක් ලිඛිතව දැනුම් දීම සඳහා භාවිතා කරන පත්‍රිකා විශේෂයකි.

(5) විදුලි සංදේශ ජාල හරහා සිදු කරනු ලබන පණිවිඩ අභ්‍යන්තර පාර්ශ්වයන් වෙත දැන්වීම සඳහා භාවිතා කරන තොරතුරු පත්‍රිකාවකි. (......)

(22) ආයතනයක් සහ එහි ශාඛාවන් අතර සන්නිවේදනය සඳහා විසිරි ඇති දුරකථන ජාලය හඳුන්වනු ලබන්නේ,

(1) ඕඩියෝ විෂනය (2) ඉන්ටර්කෝඩ් (3) එක්ස්ට්‍රා නෙට්

(4) ඉන්ට්‍රානෙට් (5) ඉන්ටර්නෙට් (......)

(23) අන්තර්ජාලය උපයෝගී කර ගෙන පෞද්ගලික පරිඝනකයක් මඟින් තවත් පෞද්ගලික පරිඝනකයකට පණිවිඩයක් යැවීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,

(1) වීඩියෝ සම්මන්ත්‍රණ (2) ගොනු හුවමාරු නියමාවලිය (3) දුරකථන සම්මන්ත්‍රණ

(4) විද්‍යුත් තැපෑල (5) හඬ තැපෑල (......)

(24) විවිධ ප්‍රවාහන ක්‍රම වලදී යොදා ගන්නා ලියවිලි විවිධ වේ. පහත දැක්වෙන්නේ එවැන්නකි.

ප්‍රවාහන ක්‍රමය	යොදා ගන්නා ලියවිල්ල
01. මහාමාර්ග ප්‍රවාහණයේ දී භාණ්ඩ ප්‍රවාහනය කිරීම.	A - නෞභාර පත්‍රය
02. මහා මාර්ග ප්‍රවාහනයේ දී මගීන් ප්‍රවාහනය කිරීම.	B - ගුවන් මාර්ග බිල්පත.
03. සාගර ප්‍රවාහනයේ දී භාණ්ඩ ප්‍රවාහනය කිරීම.	C - ප්‍රවේශ පත්‍රය.
04. ගුවන් ප්‍රවාහනයේ දී භාණ්ඩ ප්‍රවාහනය කිරීම.	D - භාරදීමේ ඇණවුම්.
05. දුම්රියෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීම.	E - දුම්රිය වාර්ථාව.

පිළිවෙලින් ප්‍රවාහන ක්‍රමය සහ ලියවිල්ල ගැලපූ විට,

(1) A B C D E (2) E D C B A (3) D C A B E

(4) C B A D E (5) E C A D B (......)

(25) නැවක් ගමන්කල යුතු නිශ්චිත ගමන් මාර්ගයෙන් බැහැරව වෙනත් ගමන් මාර්ගයක ගමන් කිරීම හඳුන්වන්නේ,

(1) නාවික වංචනය. (2) නාවික බිලි කිරීම. (3) නාවික අප ගමනය.
(4) නාවික ඇණවුම. (5) නාවික ආදේශනය. (......)

(26) වත්මන් ශ්‍රී ලංකා රජය අක්වෙරළ නගරයක් සැලසුම් කොට ඇත්තේ,

(1) කොළඹ වරාය නගර ව්‍යාපෘතිය යටතේ ය. (2) ඔලුවිල් වරාය නගර ව්‍යාපෘතිය යටතේ ය.
(3) හම්බන්තොට නගර ව්‍යාපෘතිය යටතේ ය. (4) ත්‍රිකුණාමල නගර ව්‍යාපෘතිය යටතේ ය.
(5) ගාල්ල නගර ව්‍යාපෘතිය යටතේ ය. (......)

(27) කලාපීය වශයෙන් ඇති කර ගත් වෙළඳ ගිවිසුම්, වෙළෙඳ සංවිධාන පහක් හා එම සංවිධානවල සමාජික රටවල් පහතින් දැක්වේ.

කලාපය සංවිධානය	අයිති රටවල් කීපයක්
01. යුරෝපා සංගමය. (EIJ)	A - බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව, තායිලන්තය.
02. උතුරු ඇමෙරිකානු නිදහස් වෙළඳ සංගමය. (NAFTA)	B - මහාබ්‍රිතාන්‍ය, ප්‍රංශය, බෙල්ජියම ඩෙක්මාර්කය, ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය, අයර්ලන්තය, ලක්සම්බර්ග්
03. යුරෝපීය නිදහස් වෙළෙඳ සංගමය.	C - ශ්‍රී ලංකාව, පකිස්ථානය, ඉන්දියාව, නේපාලය, මාලදිවයින, බංගලාදේශය භූතානය.
04. දකුණු ආසියානු වරණාත්මක සංගමය.	D - ස්වීඩනය, නෝර්වේ, ඔස්ට්‍රේයාව ස්වට්සර්ලන්තය, පින්ලන්තය.
05. බිම්ස්ට් - එක් (BIMST - EC)	E - ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, මෙක්සිකෝව

කලාපීය සංවිධානවලට අයත් රටවල් නිවැරදි ලෙස ගැලපූ විට පිළිතුර වන්නේ,

(1) BEDAC (2) ABCDE (3) BACDE (4) BEDCA (5) CABDE (......)

(28) දූෂ්‍ය නෞභාරපත්‍රයක් ලබා ඇති අයෙකුට පාරිශුද්ධ නෞභාරපත්‍රයක් ලබා ගැනීමට අපනයන කරුවකු භාවිතා කරන ලියවිල්ල හඳුන්වනු ලබන්නේ,

(1) කැපබල ලිපිය. (2) හානි රක්ෂණ සහතිකය. (3) හානි රක්ෂණ ලිපිය.
(4) අවලෝකන පත්‍රය. (5) මේට් රිසිට් පත්‍රය. (......)

(29) තීරු බදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු ගිවිසුම (GATT) වෙනුවට ස්ථාපිත කරන ලද සංවිධානය වන්නේ,

(1) ලෝක බැංකුව. (2) යුරෝපා සංගමය.
(3) ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය. (4) ලෝක වෙළඳ සංවිධානය.
(5) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල. (......)

(30) විදේශ වෙළෙඳාම සඳහා පදනම් වී ඇති සාධකයක් නොවන්නේ,

(1) දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කර ගත යුතුයැ යි රජය විශ්වාස කිරීම.
(2) ස්වභාවික සම්පත් බෙදී යාමේ විෂමතාව.
(3) සාපේක්ෂ පිරිවැය වාසිය.
(4) සමහර නිෂ්පාදිත සම්බන්දව ඇතැම් රටවලට නීතිමය ඒකාධිකාරයක් පැවැතීම.
(5) වෙළෙඳ බාධක අවම වීම. (......)

- **අංක 31 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට සුදුසු වචන / වචන බාණ්ඩය හිස්තැන මත ලියන්න.**

(31) (අ) විවිධ පාර්ශ්ව අතුරෙන් ව්‍යාපාර තම පැවැත්ම ''තහවුරු කර ගැනීමට සඳහා .... පිළිබඳ සැලකිලිමත් වන අතර වෙළෙඳ පොළ සුරක්ෂිත කර ගැනීම සඳහා.................. .... පිළිබඳ සැලකිලිමත් වේ.

(ආ) බේකරියක ව්‍යාපාර ක්‍රියාවලිය තුළ, බේකරිය පිහිටි ඉඩම.. යන නිෂ්පාදන සාධකයට අයත් වන අතර බේකරි ගොඩනැගිල්ල.. යන නිෂ්පාදන සාධකයට අයත් වේ.

(32) (අ) ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාර කටයුත්තක් පවත්වාගෙන යාමට ඇති හැකියාව.. ලෙස හඳුන්වන අතර ව්‍යාපාර කටයුත්තක් ඇරඹීමට හෝ පවත්වාගෙන යාමට ඇති නොහැකියාව .... ලෙස හැඳින් වේ.

(ආ) වනාන්තර .... පරිසරයට අයත් වේ. නමුත් ව්‍යාපාර කටයුතු සඳහා ගස් කැපීමට අවසර ලබා ගැනීම.. පරිසරයට අයත් වේ.

(33) (අ) ව්‍යාපාරයක හැසිරීම පාලනය කරන නීති හෝ සම්මතයන් .... ලෙස හැඳින්වෙන අතර සාධාරණව හා නීත්‍යානුකූලව ව්‍යාපාර කටයුතු කරගෙන යාම හඳුන්වනුයේ.. ලෙසය.

(ආ) ඉහළ වටිනාකමක් ඇති.. අඩු වටිනාකමක් ඇති.. .... බවට පත් කිරීම අවචක්‍රීකරණය (Low Cycle) ලෙස හැඳින්වේ.

(34) (අ) මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ.. පාලනය කිරීම වන අතර එහිදී දිගු කාලයක් පුරා මිල මට්ටම.. පවත්වාගෙන යාම අපේක්ෂා කරයි.

(ආ) ජගත් පාරිභෝගික දිනය .... ට යෙදෙන අතර ජගත් පරිසර දිනය............... .... ට යෙදෙයි.

(35) (අ) කේවල ස්වාමි ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නාමකින් පවත්වාගෙන යන්නේ නම් .... දරන .... ආඥා පනත යටතේ ලියාපදිංචි කල යුතුය.

(ආ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ උපරිම සීමාව .... දරණ .... පනත යටතේ 20 කට සීමා කර ඇත.

(36) (අ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව .... ට අඩු ව්‍යාපාර ද කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය....................................... ට අඩු ව්‍යාපාර ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස හඳුන්වයි.

(ආ) බදු සහන, ණය පහසුකම් වැනි දෑ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීම සඳහා ලබා දෙනු ලබන .... , දිරි ගැන්වීම් සඳහා උදාහරණ වේ.

(37) (අ) සර්වෝදය, ජයිකා වැනි ආයතන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට දිරිගැන්වීම් ලබා දෙන ...., නොවන ආයතන වන අතර, ශ්‍රී ලංකා පමීති ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය, ආදිය එසේ දිරිගැන්වීම් සපයන .... ආයතන වලට නිදසුන් වේ.

(ආ) අන්තර්ජාතික සහයෝගිතාව සඳහා වූ ජපාන බැංකුව (JBIC) මූල්‍ය අනුග්‍රහය සපයන .... ව්‍යාපෘතිය සඳහා .... ප්‍රතිමූල්‍ය පහසුකම් සපයයි.

(38) (අ) පාරිභෝගිකයන් වෙත භාණ්ඩ සෘජුවම ලබාදීම සඳහා අන්තර්ජාලය භාවිතා කිරීම................................ .... වෙළෙඳාම නමින් හඳුන්වා දිය හැකිය.

(ආ) සමාන යෙදෙවුම් ප්‍රමාණයකින් එක් රටකට වෙනත් රටකට වඩා කාර්යක්ෂම ලෙස භාණ්ඩ නිපදවීමේ හැකියාව... ලෙස හඳුන්වයි.

(39) (අ) රක්ෂණ විෂයේ දී මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කලහැකි හානියක් සිදු වීමට ඉඩකඩ .... ලෙස හැඳින්විය හැකි අතර, අලාභය ඇති වීමට හේතුව හෙවත් හානිය .... ලෙස හැඳින් වේ.

(ආ) රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවදානමක් එම රක්ෂණ සමාගම විසින් තවත් රක්ෂණ සමාගමක් හෝ සමාගම් කීපයක රක්ෂණය කිරීම .... ලෙස හැඳින් වේ.

(40) (අ) ඇමෙරිකාවේ නිව් හැම්ෂයර් ප්‍රාන්තයේ බ්‍රෙට්න් වුඩ්ස් නගරයේ පවත්වන ලද සම්මේලනයට අනුව 1947 දෙසැම්බර් 27 වන දින .... ආරම්භ කරන ලදී.

(ආ) ගෝලීය උණුසුම අඩු කිරීම පෙරදැරිව හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම, තරඟකාරී මිලක් යටතේ විකිණීම සඳහා ගොඩනැගී ඇති ජාත්‍යන්තර වෙළඳපොළ .... නමින් හැඳින් වේ.

- **අංක 41 සිට 50 තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) ව්‍යවමනාවක ලක්ෂණ 04 ක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

(42) ව්‍යාපාර විසින් එහි සේවකයන් කෙරෙහි ඉටු කළයුතු සමාජ වගකීම් 04 ක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

(43) සෘජු බදු සඳහා උදාහරණ 04 ක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

(44) ජෝන්. එෆ්. කෙනෙඩි මහතා විසින් ප්‍රකාශයට පත් කළ පාරිභෝගික අයිතිවාසිකම් 04 ක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

(45) පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාර වල ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(46) වරලත් ව්‍යාපාර මගින් වරලත් ලාභියාට ලැබෙන වාසි 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(47) ව්‍යවසායකත්ව කුසලතා 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(48) ශ්‍රීලංකා මහ බැංකුව රජයේ බැංකුව ලෙස හැඳින්වීමට හේතු 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(49) ණයපනතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව 04 නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(50) දේශීය වෙළෙඳාමේ දී භාවිතා වන ලියවිලි හතරක් නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: ....

ව්‍යාපාර අධ්‍යයනය - II

කාලය පැය 03 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-
- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

I කොටස

01. රූපලාවන්‍ය පාඨමාලාවක් සාර්ථකව නිම කිරීමෙන් පසු කුෂානි රාජපක්ෂ විසින් ''තුෂාරා'' නමින් රූපලාවන්‍යාගාරයක් ආරම්භ කර පවත්වාගෙන යයි. මේ සඳහා ඇය විසින් ඉතිරි කර ගත් රු. 400 000/= ක මුදලට අමතරව ලංකා බැංකුවෙන් රු. 800 000/= ක ණය මුදලක් ද ලබා ගත්තා ය. ඉන් රු. 1000 000/= ක මුදලක් වැය කර ගොඩනැගිල්ලක් මිලදී ගත් අතර තවත් රු. 200 000 ක් වැය කර තම නිෂ්පාදනයේ ගුණත්වය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය නවීන උපකරණ කට්ටලයක් ඉන්දියානු සමාගමකින් ආනයනය කළාය. ආයතනයේ කළමනාකරු ලෙස අමරනාත්ව බඳවා ගත් අතර පුහුණු කාර්යය මංඩලයක් ද ඇය සතුව සිටියි. ගනුදෙනුකරුවන්ට මෙම ආයතනය වෙත පැමිණ හෝ තම නිවෙස් වෙත කාර්යය මංඩලය ගෙන්වා ගෙන හෝ තමන් ට අවශ්‍ය පහසුකම් සලසා ගත හැක.

(i) අ) ''තුෂාරා'' ව්‍යාපාරය කෙරෙහි ඇල්ම දක්වන සිද්ධියේ සඳහන් පාර්ශව 05 ක් නම් කරන්න. (ල.02)

ආ) තුෂාරාගේ ව්‍යාපාරය සපයන '' නිෂ්පාදනයේ'' ස්වභාවය නම් කර, ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල.02)

(ii) අ) මෙම ව්‍යාපාරය පහත නිර්ණායක අනුව වර්ග කරන්න.
(1) හිමිකාරිත්වය (2) අරමුණු (3) පරිමාණය (4) නිෂ්පාදන අංශය (ල.04)

(iii) අ) තුෂාරා ව්‍යාපාරයේ ශක්තීන් හා දුර්වලතා දෙක බැගින් ලියන්න. (ල.02)

ආ) රටේ ආර්ථික සංවර්ධනයට තුෂාරා ව්‍යාපාරය දායක වන ආකාර 02 ක් ලියන්න. (ල.02)

(iv) අ) තුෂාරා ව්‍යාපාරය ඉටු කරනු ලබන්නේ පුද්ගල අවශ්‍යතාවයක් ද වුවමනාවක් ද යන්න දක්වා, ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල.02)

ආ) තුෂාරා ව්‍යාපාරයේ ''මිල'' හැර පාරිභෝගික ඉල්ලුම වැඩි කර ගැනීම සඳහා යොදා ගෙන ඇති වෙනත් උපක්‍රම දෙකක් ලියන්න. (ල.02)

(v) අ) වෙළෙඳාමේ ප්‍රධාන ප්‍රභේද දෙක දක්වා, තුෂාරා ව්‍යාපාරය ඇසුරින් උදාහරණ සපයන්න. (ල.02)

ආ) තුෂාරා ව්‍යාපාරයේ ''ව්‍යාවසායකත්වයට'' අමතරව යොදාගෙන ඇති සම්පත් 04 ක් නම් කර උදාහරණ දෙන්න. (ල.02)

02. (i) අ) ව්‍යාපාර කාර්යයන් 04 ක් ලියන්න. (ල.02)

ආ) ප්‍රධාන ව්‍යාපාර කටයුතු 02 ක් නම් කරන්න. (ල.02)

(ii) අ) ව්‍යාපාරයක ''ආචාර ධර්ම සංග්‍රහ'' යනුවෙන් කුමක් අදහස් කරයි ද? (ල.02)

ආ) එවැනි ආචාරධර්ම සංග්‍රහයක් ගොඩනැගීමේ දී සැලකිල්ලට ගතයුතු කරුණු මොනවාද? (ල.02)

(iii) අ) තිරසර සංවර්ධනය යන්න හඳුන්වන්න. (ල.02)

ආ) ප්‍රතිචක්‍රීකරණය යන්න හඳුන්වා එහි ප්‍රධාන ආකාර 02 ක් නම් කරන්න. (ල.02)

(iv) අ) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පෙන්වා දී ඇති පරිදි ව්‍යාපාර වල සමාජ වගකීම් ලෙස ප්‍රමුඛතාව දිය යුතු ක්ෂේත්‍ර 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) සමාජ වගකීම් නිසිලෙස ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට අත්සත් කරගත හැකි වාසි දෙකක් හා අවාසි 02 ක් නම් කරන්න. (ල.02)

(v) අ) ශ්‍රී ලංකාව තුළ, ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම සිදුවන ආකාර 03 නම් කරන්න. (ල.02)

ආ) රජය විසින් ව්‍යාපාර සඳහා යටිතල පහසුකම් සපයයි. මේ සඳහා නිදසුන් ඉහත සඳහන් කළ ආකාර 03 ක් යටතේ ඉදිරිපත් කරන්න. (ල.02)

03. (i) අ) ''ආර්ථික ස්ථායිතාව'' යන්න හඳුන්වන්න. (ල.02)

ආ) ආර්ථික ස්ථායිතාව කොටස් දෙකකින් යුක්තය. නම් කරන කෙටි හැඳින්වීමක් කරන්න.(ල.02)

(ii) අ) පිස්කල් ප්‍රතිපත්තිය කෙටියෙන් හඳුන්වා එහි අරමුණු ලියා දක්වන්න. (ල.02)

ආ) මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව භාවිතා කරනු ලබන උපකරණ 04 ක් නම් කරන්න. (ල.02)

(iii) අ) ''පාරිභෝගික ආරක්ෂණය'' යන්න හඳුන්වන්න. (ල.02)

ආ) ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් කටයුතු කරන ආයතන 04 ක් සඳහන් කරන්න. (ල.02)

(iv) අ) රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම ගැලීම් සටහනක දක්වන්න. (ල.02)

ආ) කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පියවර වශයෙන් සඳහන් කරන්න. (ල.02)

(v) අ) සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා සමාගම් රෙජිස්ටාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි සඳහන් කරන්න. (ල.02)

ආ) ඇපයෙන් සීමිත සමාගමක දක්නට ලැබෙන ලක්ෂණ 4 ක් සඳහන් කරන්න. (ල.02)

04. (i) අ) මැන්චෙස්ටර් සමුළුවේ දී ඉදිරිපත් කළ සමුපාකාර ප්‍රතිපත්ති 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර යන්න හඳුන්වන්න. (ල.02)

(ii) අ) ව්‍යාපාර ඒකාබද්ධවීම යනු කුමක්දැයි දක්වා එය සිදුවිය හැකි ආකාර පැහැදිලි කරන්න.(ල.02)

ආ) රාජ්‍ය සංස්ථාවක දැකිය හැකි ලක්ෂණ සඳහන් කරන්න. (ල.02)

(iii) අ) රාජ්‍ය සමාගම් යන්න නිර්වචනය කොට උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ල.02)

ආ) ව්‍යවසායකත්වය පිළිබඳව අන්තර්ජාතික කම්කරු සංවිධානය විසින් ලබාදෙන ලද නිර්වචනය සඳහන් කරන්න. (ල.02)

(iv) අ) ව්‍යවසායකත්වයේ ආයතනික ප්‍රතිලාභ 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 04 ක් සඳහන් කරන්න. (ල.02)

(v) ''සියළු ව්‍යවසායන් ව්‍යාපාර වන අතර සියළු ව්‍යාපාර ව්‍යවසායන් නොවේ.'' පැහැදිලි කරන්න. (ල.04)

II කොටස

05. (i) ආ) ඇමරිකා එක්සත් ජනපදයේ Small - Business Administration Institute විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඉදිරිපත් කර ඇති නිර්වචනය සඳහන් කරන්න. (ල.02)

ආ) රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දායක වන ආකාර 04 ක් සඳහන් කරන්න. (ල.02)

(ii) අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු 04 ක් සඳහන් කරන්න.(ල.02)

ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීම සඳහා සපයනු ලබන මූල්‍යමය නොවන දිරි ගැන්වීම් 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(iii) අ) ඉතුරුම් තැන්පතු හා ඉල්ලුම් තැන්පතු අතර වෙනස් කම් 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) බලපත්‍ර ලාබී මුදල් සමාගමක කාර්යභාරයන් 04 ක් සඳහන් කරන්න. (ල.02)

(iv) වාණිජ බැංකු තරඟකාරීත්වය ජය ගැනීම සඳහා ගෙන ඇති පියවර මොනවාද? (ල.02)

(v) අ) චෙක්පතක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් දක්වන්න. (ල.02)

ආ) රේඛීය චෙක්පත් ව්‍යාපාරිකයන් අතර වඩා ජනප්‍රිය වීමට හේතු මොනවා ද? (ල.02)

06. (i) අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන් මොනවා ද? (ල.02)

ආ) හොඳ මුදලක් ලක්ෂණයක් වන්නේ පොදු පිලිගැනීමයි. ගනුදෙනුවේ දී පොදු පිළිගැනීමක් ඇති වීමට නම් මුදලෙහි තවත් ලක්ෂණ කිහිපයක් තිබිය යුතුය. එවැනි ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල.02)

(ii) සුරාජ් තම මෝටර් රථය රු. මිලියන 5.0 ජනිදු ට අලෙවි කළේය. ජනිදු එම අවස්ථාවේ දී රු. මිලියන 3.0 ක් සුරාජ් ට ගෙවූ අතර, ඔහු එම මුදල් බැංකුවේ තැන්පත් කළේය. ඉතිරි මිලියන 2.0 ක මුදල මාස 4 කින් ගෙවීමට ජනිදු එකඟ විය.

අ) ඉහත සිද්ධියට අනුව මුදලින් ඉටු වී ඇති කාර්යයන් මොනවාද? (ල.02)

ආ) විද්‍යුත් මුදල් මගින් ගෙවීම් කිරීම් පහසු කිරීම සඳහා තවත් පහසුකම් රාශියක් අවශ්‍ය වේ. එම පහසුකම් 04 ක් සඳහන් කරන්න. (ල.02)

(iii) අ) රක්ෂණය කළ හැකි අවදානමක තිබිය යුතු ලක්ෂණ මොනවා ද? (ල.02)

ආ) රක්ෂණය හා ආරක්ෂණය අතර වෙනස් කම් 04 ක් දක්වන්න. (ල.02)

(iv) අ) වගකීම් රක්ෂණය යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග 02 ක් නම් කර, පැහැදිලි කරන්න. (ල.02)

ආ) වර්තමානයේ රක්ෂණ සේවාවේ දක්නට ලැබෙන ප්‍රවණතා මොනවා ද? (ල.02)

(v) අ) සන්නිවේදනය වර්ගී කළ හැකි පදනම් හතරක් නම් කරන්න. (ල.02)

ආ) හොඳ අභ්‍යන්තර සන්නිවේදන ක්‍රමයක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරයකට අත් වන ප්‍රතිලාභ කවරේ ද? (ල.02)

07. (i) අ) සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග 04 ක් නම් කරන්න. (ල.02)

ආ) සඵලදායී සන්නිවේදනය යනු කුමක් ද? (ල.02)

(ii) අ) සඵලදායී සන්නිවේදනයක ගුණාංග කවරේ ද? (ල.02)

ආ) විද්‍යුත් සන්නිවේදන මාර්ග 04 ක් නම් කරන්න. (ල.02)

(iii) අ) වර්තමානයේ දී ප්‍රවාහන කටුයතු වලදී ගෝලීය තැන් සෙවුම් පද්ධති (GPS) බහුලව භාවිත කරයි. භාණ්ඩ බෙදා හැරීමේ ව්‍යාපාරවලට එමගින් අත්වන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න. (ල.02)

ආ) ගබඩාකරණ ක්‍රියාවලිය ලියා දක්වන්න. (ල.02)

(iv) අ) ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සැලකිලිමත්විය යුතු කරුණු 04 ක් නම් කරන්න. (ල.02)

ආ) ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරීමේ දී භාවිතා කරන විවිධ උපකරණ 04 ක් නම් කරන්න. (ල.02)

(v) සැපයුම් දාම කළමනාකරණයේ ප්‍රයෝජන කවරේ ද? (ල.04)

08. (i) අ) ලෝකයේ සෑම රටක්ම විදේශ වෙළඳාම හා සම්බන්ධ වී සිටී. එහි දී විදේශ ගැනුම්කරුවෙකු සොයා ගැනීමට තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර මොනවා ද? (ල.02)

ආ) විද්‍යුත් වාණිජ්‍ය ප්‍රචලිත වී තිබුණ ද එහිදී ද සීමා දැකිය හැක. ඒ මොනවා ද? (ල.02)

(ii) අ) 'වර්තමාන ශ්‍රී ලංකාවේ සිල්ලර වෙළෙඳාම තුළ දක්නට ලැබෙන ප්‍රවණතාවයක් ලෙස වෙළඳසැල් රහිත සිල්ලර වෙළඳාම දැක්විය හැකිය.'

ඉහත වෙළඳසැල් ක්‍රියාත්මක වන විවිධ ආකාර 04 ක් නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න.

(ල.02)

ආ) වෙළඳාම සඳහා අතරමැදින් යොදවා ගැනීමේ වාසි හා අවාසි දෙක බැගින් නිෂ්පාදකයාගේ දෘෂ්ටි කෝණයෙන් දක්වන්න. (ල.02)

(iii) අ) රටවල් අතර ඇතිකර ගන්නා සහයෝගීතා ගිවිසුම් හෙවත් සංවිධාන මගින් කවර ප්‍රතිලාභ අත්කර ගැනීමට එම රටවල් අපේක්ෂා කරයි ද? (ල.02)

ආ) පහත කරුණු වලින් දෙකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

(a) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

(b) G8 කණ්ඩායම

(c) අපනයන සංවර්ධන මණ්ඩලය

(d) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

(iv) අ) ශ්‍රී ලංකාවේ අපනයනකරුවෙකුට විදේශීය ගැනුම්කරුවෙකුට කලාත්මක ගෘහ භාණ්ඩ තොගයක් සැපයීම සඳහා ඇණවුම් ලැබී ඇත. මෙම ඇණවුම සපුරාලීම සඳහා අපනයනකරුවෙකු වශයෙන් ගත යුතු ක්‍රියා පිළිවෙල පැහැදිලි කරන්න. (ල.02)

ආ) වර්තමානයේ විදේශ වෙළඳාම සම්බන්ධව ඇති වී තිබෙන නව ප්‍රවණතා කවරේ ද? (ල.02)

(v) විද්‍යුත් වෙළෙඳාම (E-trade) ප්‍රචලිත වීමට බලපා ඇති කරුණු 08 ක් දක්වන්න. (ල.02)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය - 2023

12 ශ්‍රේණිය | ව්‍යාපාර අධ්‍යයනය | පිළිතුරු පත්‍රය

I පත්‍රය

1 -(4)	2 -(2)	3 -(5)	4 -(2)	5 -(2)	6 -(1)	7 -(3)	8 -(2)	9 -(1)	10-(1)
11-(5)	12-(2)	13-(2)	14-(3)	15-(4)	16-(3)	17-(3)	18-(3)	19-(5)	20-(4)
21-(4)	22-(2)	23-(4)	24-(3)	25-(3)	26-(1)	27-(4)	28-(3)	29-(4)	30-(1)

(31) (අ) අයිතිකරුවන් /ගනුදෙනු කරුවන් (පාරිභෝගිකයන්) (ආ) භූමිය / ප්‍රාග්ධනය

(32) (අ) ශක්තීන් / දුර්වලතා (ආ) ස්වභාවික / නෛතික

(33) (අ) ව්‍යාපාර ආචාර ධර්ම / ව්‍යාපාර සමාජ වගකීම් (ආ) නිෂ්පාදිත / අමුද්‍රව්‍ය

(34) (අ) උද්ධමනය / ස්ථාවරව (ආ) ඔක්තෝම්බර් - 14 / ජූනි 05

(35) (අ) 1918 අංක 06, ව්‍යාපාර නාම. (ආ) 2007 අංක 07, සමාගම්.

(36) (අ) යොදවා ඇති ප්‍රාග්ධනය මිලියන 04. /ආයෝජිත ප්‍රාග්ධනය මිලියන 20. (ආ) මූල්‍යමය.

(37) (අ) රාජ්‍ය නොවන, රාජ්‍ය (ආ) සුවන (ස්මයිල්), ජාතික සංවර්ධන බැංකුව

(38) (අ) විද්‍යුත් වෙළෙඳාම (ආ) නිරපේක්ෂ වාසිය.

(39) (අ) (1) අවදානම (2) උපද්‍රව්‍ය (ආ) ප්‍රතිරක්ෂණය

(40) (අ) ලෝක බැංකුව (ආ) කාබන් වෙළඳපොළ

(41) 1. අසීමිත වීම 2. විවිධ වීම. 3. අත්‍යාවශ්‍ය නොවීම
4. නිර්මාණය කළ හැකි වීම. 5. සමාජ බලවේග මගින් වෙනස් කළ හැකි වීම.

(42) 1. සමානාත්මතාව 2. මනා සේවක සබඳතා 3. වෘත්තීයමය ආරක්ෂාව සපයා දීම
4. සෞඛ්‍ය පහසුකම් ලබාදීම.

(43) 1. පුද්ගල ආදායම් බදු 2. සමාගම් බදු 3. රඳවා ගැනීමේ බදු
4. ප්‍රාග්ධන ලාභ මත බදු 5. උපයන විට ගෙවීම් බදු

(44) 1. ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය 2. තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය.
3. තෝරා ගැනීමට ඇති අයිතිය. 4. සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය.

(45) 1. නගර සභා, මහනගර සභා, ප්‍රාදේශීය සභා වැනි ආයතන යටතේ පැවැතීම.
2. අයිතිය පළාත් පාලන අයාතන සතු වීම.
3. පරිපාලනය පළාත් පාලන අධිකාරීන් සිදු කිරීමට.
4. අවශ්‍ය අරමුදල් පළාත් පාලන ආයතන සැපයීම.

(46)
- වරලත් හිමියාගේ කීර්තිනාමය මත විශාල වෙළඳපලක් හිමිවීම.
- අසාර්ථක වීමේ ප්‍රවණතාව අඩු වීම.
- ජනප්‍රිය වෙළඳනාම නිසා ප්‍රචාරණය පහසු වීම.
- වරලත් හිමියාගෙන් කළමනාකරණ පුහුණුව ලැබීම.
- වරලත් හිමියාගෙන් මූල්‍ය පහසුකම් ලැබීම.

II පත්‍රය

- අමුද්‍රව්‍ය අවම මිලකට ලබා ගත හැකි වීම.

(47) • නායකත්ව කුසලතා • අන්තර් පුද්ගල හැකියා. • සන්නිවේදන කුසලතා
- මූලික කළමණාකරන කුසලතා.

(48) 1. රජයේ විවිධ ගිණුම් පවත්වාගෙන යාම. 2. රජ්‍ය ණය කළමණාකරණය.
3. රජයේ ආර්ථික උපදේශකයා වීම.
4. රජය වෙනුවෙන් අන්තර්ජාතික සංවිධාන සහ රටවල් සමඟ කටයුතු කිරීම.

(49) 1. ණයපත් හිමියා. 2. ණයපත් මගින් භාණ්ඩ විකුණනු ලබන ආයතනය (විකුණුම්කරු)
3. ණයපත් නිකුත් ආයතනය. 4. ණයපත් සංගමය.

(50) 1. මිල විමසුම. 2. මිල කියුම. 3. ඇණවුම.
4. මුදල් මැමය. 5. ලදුපත. 6. ගෙවීම් වව්චරය.
7. ඉන්වොයිසිය.

<u>I කොටස</u>

01. (i) අ) ★ කුෂාණි / අයිතිකරු ★ අමරනාත් / කළමණාකරු ★ ලංකා බැංකුව
★ කාර්ය මංඩලය ★ ගනුදෙනුකරුවන් (ල. 1/2 x 04 = 02)

ආ) සේවාවකි. (ල. 01) ★ භෞතික පැවැත්මක් නැති වීම / මිනිස් ක්‍රියාවලියක් වීම. (ල. 01)

(ii) • හිමිකාරිත්වය : පෞද්ගලික අංශය. • අරමුණ : ලාභය • පරිමාණය : සුළු / සුළු හා මධ්‍ය
• නිෂ්පාදනයේ ස්වභාවය : තෘතියික (ල. 1/2 x 4 = 02)

(iii) අ) ශක්තීන් :- (1) රූපලාවණ්‍ය පාඨමාලාවක් හදාරා තිබීම. (2) පුහුණු කාර්ය මංඩලයක් සිටීම.
(3) නවීන උපකරණ භාවිතය. (ල. 1/2 x 2 = 01)

දුර්වලතා:- (1) ණය ප්‍රාග්ධනය වැඩි වීම. (2) කාරක ප්‍රාග්ධන ගැටලු මතු වීම.
(ල. 1/2 x 2 = 01)

ආ) (1) රැකියා නියුක්තියට දායක වීම මගින්. (2) බදු ගෙවීම තුළින්.
(3) සංකීර්ණ මිනිස් වුවමනා සපුරාලීම මගින්. (4) දළ දේශීය නිෂ්පාදිතයට දායක වීම මගින්.
(ල. 1 x 2 = 02)

(iv) අ) වුවමනාවකි. (ල. 01)

ආ) (1) ගුණත්වය රැක ගැනීමට කටයුතු කිරීම. (නවීන උපකරණ භාවිතයෙන්) (ල. 01)
(2) ගනුදෙනුකරුවන්ගේ නිවසටම පැමිණ සේවා සැලසීම මගින්. (පහසුකම් වැඩි කිරීම මගින්)(ල. 01)

(v) අ) දේශීය වෙළෙඳාම. උදා:- රු. 1 000 000/= කට ගොඩනැගිල්ලක් මිලදී ගැනිම. (ල. 01)
විදේශීය වෙලෙඳාම උපකරණ කට්ටලයක් ආනයනය කිරීම. (ල. 01)

ආ) ★ භූමිය - උදා:- ගොඩනැගිල්ල පිහිටි ඉඩම ★ ශ්‍රමය - සේවකයන් ★ ප්‍රාග්ධනය - ගොඩනැගිල්ල /උපකරණ / මුදල් ★ දැනුම - සේවක කුසලතා / කළමනාකරණ දැනුම. ★ කාලය ★තොරතුරු
(ල. 1/2 x 4 = 02)

02. (ii) අ) • මෙහෙයුම් කටයුතු. • මූල්‍ය කටයුතු • අලෙවි කටයුතු. • මානව සම්පත් කළමණාකරණය.
• පර්යේෂණ හා සංවර්ධනය. • පරිපාලනය.

ආ) (1) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම. (2) සම්පත් වලට අගය එකතු කිරීම. (ල. 02)

(ii) අ) ව්‍යාපාරයක් සිය කටයුතු කරගෙන යාමේ දී තමාට මෙන්ම සෙසු පාර්ශවයන්ගේ පුළුල් වශයෙන් මුලු මහත් සමාජයටත් යහපතක් සැලසෙන පරිදි කටයුතු කිරීම සම්බන්ධව ඇති කරගත් ලිඛිත ආචාර ධර්ම පද්ධතිය මින් අදහස් වේ. (ල. 02)

ආ) (1) තම ව්‍යාපරයේ ස්වභාවය. (2) ව්‍යාපාරයේ අයිතකරුවන් පිළිබඳව, (3) ව්‍යාපාරයේ සේවකයන් පිළිබඳව. (4) ගනුදෙනුකරුවන් හා තරඟකරුවන් පිළිබඳව, (5) සමාජ හා සංස්කෘතික පරිසරය පිළිබඳව. (6) ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ද යන බව. (ල. 1/2 x 4 = 02)

(iii) අ) අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුර ගැනීමේ අයිතිය උල්ලංගනය නොකරමින් වර්තමාන අවශ්‍යතා ලගා කර ගන්නා වූ සංවර්ධනය තිරසර සංවර්ධනයයි. (ල. 02)

ආ)ඉවත ලන අපද්‍රව්‍ය වෙන්කොට වෙනත් භාණ්ඩයක් නිපදවිය හැකි ද්‍රව්‍ය බවට පත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිචක්‍රීකරණයයි.

(1) අඩු වටිනාකමක් ඇති ද්‍රව්‍ය ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත බවට පත් කිරීම. - අධිචක්‍රීකරණය.

(2) ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත අඩු වටිනාකමක් ඇති ද්‍රව්‍ය බවට පත් කිරීම. - අවචක්‍රීකරණය.

(ල. 02)

(iv) අ) මානව අයිතීන්, සේවක අයිතීන්, පරිසර ආරක්ෂාව, ප්‍රජා සේවා. (ල. 02)

ආ) වාසි : - (1) ව්‍යාපාරයේ ප්‍රතිරූපය වර්ධනය වීම. (2) සමාජ වගකීම් ඉටු කරන නිසා රජයේ පාලනය අවම වීම. (3) ව්‍යාපාර කටයුතු සඳහා රජයෙන් ලැබෙන සහය ඉහළ යාම. (ල. 02)

අවාසිඃ- (1) ලාභ උපරිමයට බාධා පැමිණීම. (2) ව්‍යාපාරයේ කාර්‍යක්ෂමතාවයට බාධා පැමිනීම. (3) සමාජ වගකීම් ඉටු නොකරණ ව්‍යාපාර සමග තරග කිරීම අසීරු වීම.

(v) අ) ● මධ්‍යම රජය හරහා ● පළාත් සභා හරහා ● පළාත් පාලන ආයතන හරහා (ල.02)

ආ) ● මධ්‍යම රජය - විදුලි බලය සැපයීම. ● පළාත් සභාව - මාර්ග නඩත්තුව. ● පළාත් පාලන ආයතනය - අපද්‍රව්‍ය ඉවත් කිරීම. (හෝ සුදුසු පිළිතුරක්) (ල.02)

03. (i) අ) ● දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් අර්බුධයක් ඇති නොවීමට යම් ආර්ථිකයකට ඇති ඔරොත්තු දීමේ හැකියාව ''ආර්ථික ස්ථායිතාවය'' ලෙස හැඳින්වේ. (ල. 02)

ආ) (i) - ⋆ අභ්‍යන්තර මිල ස්ථායිතාව, ⋆ ආර්ථිකයේ උද්ධමනය පාලනය, පොලී අනුපාතය පාලනය, මිල මට්ටම ස්ථාවරව පවත්වා ගැනීම යනාදිය. (ල. 01)

(ii) - ● බාහිර මිල ස්ථායිතාව. ● විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම.(ල. 01)

(ii) අ) රජයේ ආදායම හා වියදම සම්බන්ධව රජය සිදු කරනු ලබන කටයුතු පිස්කල් ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ. (ල. 01)

අරමුණ : සාර්ව ආර්ථික ස්ථායිතාව රැක ගැනීම. (ල. 01)

ආ) ● පොලි අනුපාතිකය. ● සංචිත අවශ්‍යතා වෙනස් කිරිම. ● විවෘත / විවට වෙළඳපොල කටයුතු. ● වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම. ● ණය සීමා පැණවීම. (ල. 1/2 x 4 = 02)

(iii) අ) පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණ. (ල. 02)

ආ) ⋆ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය. ⋆ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය. ⋆ මිණුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තුමේන්තුව. ⋆ ප්‍රාදේශීය සේවා වෛද්‍ය සේවා නිලධාරි කාර්‍යාලය. ⋆ දිස්ත්‍රික් ලේකම් කාර්‍යාලය. ⋆ මහජන උපයෝගීතා කොමිෂම. (ල. 1/2 x 4 = 02)

(iv) අ)

රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන

- මධ්‍යම රජය යටතේ පවතින ව්‍යාපාර
  - රජයේ දෙපාර්තමේන්තු
  - රාජ්‍ය සංස්ථා
  - රාජ්‍ය සමාගම්
- පළාත් සභා යටතේ පවතින ව්‍යාපාර
- පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාර

(නිවැරදි සටහනට ලකුණු 02 යි)

ආ) ● ව්‍යාපාරය පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කේවල ස්වාමි ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රයක් ලබා ගැනීම.

● අදාල ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරියෙක් ව්‍යාපාර නාම ලියිපදිංචි කිරීම සඳහා වන ග්‍රාම නිලධාරී වාර්තාව ලබා ගැනීම.

● අදාල අයදුම් පත්‍රය, ග්‍රාම නිලධාරී වාර්තාව හා ලියාපදිංචි ගාස්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත බාරදීම.

● ප්‍රාදේශීය ලේකම් විසින් අදාල කරුණු සලකාබලා ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම.

(නිවැරදි අනුපිළිවෙල සහිත කරුණු 04 ට ල. 02යි)

(v) අ) ⋆ සමාගම් ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය. ⋆ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය.

⋆ සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ක්‍රියාකිරීමට එක් එක් ආරම්භක අධ්‍යක්ෂකවරුන්ගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය. ⋆ සමාගමේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට කැමැති බවට ආරම්භක ලේකම්වරයාගේ ප්‍රකාශය. (නිවැරදි කරුණු 04 ට ලකුණු 02)

ආ) ● පොදු පරමාර්ථ පෙරදැරිකරනගෙන ආරම්භ කිරීම. ● කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම.

● සමාගමේ ලාභ බෙදාහැරීමක් සිදු නොකිරීම. ● අවම සාමාජිකයින් දෙදෙනෙකුවත් සිටිය යුතු වන අතර උපරිමය පිළිබඳ සීමාවක් නොවීම. ● සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමේ දී දායක විය යුතු ප්‍රමාණයන් සඳහන් කිරීම. (කරුණු 04 ට ලකුණු 02)

04. (i) අ) ● ස්වෙච්ඡා හා විවෘත සාමාජිකත්වය. ● ප්‍රජාතාන්ත්‍රවාදී සාමාජික පාලනය. ● සාමාජික ආර්ථික සහභාගිත්වය. ● ස්වෛරීභාවය හා නිදහස. ● සමුපාකාර අධ්‍යාපනය පුහුණුව හා තොරතුරු ලබා දීම. ● ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සමිති අතර සහයෝගිතාව. ● සමාජය පිලිබඳ සැලකිලිමත් වීම. (කරුණු 04 කට ලකුණු 02)

ආ) ⋆ වරලත් හිමියාගේ නමින් හා ක්‍රමය යටතේ වයාපාරය පවත්වාගෙන යාමට වරලත් ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර වේ. (ලකුණු02)

(ii) අ) ● ඒකාබද්ධවීම යනුවෙන් වෙන්ව පැවති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීමයි. එක් සමාගමක් අනෙක් සමාගමේ වත්කම් හා වගකීම් මිලට ගැනීමෙන් හෝ ඒකාබද්ධ වන සමාගම් වල ව්‍යාපාර කටයුතු නිමකර නව සමාගමක් පිහිටුවීමෙන් යන දෙආකාරයෙන්ම ඒකාබද්ධ වීම් සිදුවිය හැක. (නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 02)

ආ) ● විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථා කිරීම. ● නෛතික පුද්ගලභාවයක් හිමි වීම. ● පූර්ණ අයිතියක් හෝ වැඩි අයිතියක් රජය සතුවීම. ● රජය විසින් පත් කරන අධ්‍යක්ෂක මණ්ඩලයකින් පාලනය

වීම. ● රාජ්‍ය ණය, ලාභාංශ ප්‍රති ආයෝජන, මහජනතාව ණය ප්‍රාග්ධනයට දායක කර ගැනීම. ආදියෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම. ● අවම මිලකට ජනතාවට කාර්යක්ෂම ලෙස භාණ්ඩ හා සේවා සැපයීම අරමුණ වීම. (ලක්ෂණ 04 කට ලකුණු 02)

(iii) අ) 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති සීමිත පොදු සමාගම් වන මේවායේ මුළු ප්‍රාග්ධනයෙන් 51% හෝ වැඩි ප්‍රමාණයක් රජය හෝ රජයට අනුබද්ධිත ආයතනය සතු වේ. මෙවැනි ආයතන රාජ්‍ය සමාගම් ලෙස හඳුන්වයි.

උදා :- ● සී / ස ලිට්‍රෝ ගෑස් සමාගම. ● සී/ස ලංකා පොස්පේට් සමාගම. ● සී/ස ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම. (නිර්වචනයට ලකුණු 01 යි නිවැරදි ගැළපෙන උදාහරණ 02 කට ලකුණු 01 යි)

ආ) නව ව්‍යාපාරයක් දියත්කොට සාර්ථකව පවත්වාගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි.(ල. 02)

(iv) අ) ● තරඟකාරිත්වයට මුහුණ දීමට පහසු වීම. ● ව්‍යාපාර කටයුතු පුළුල් වීම. ● අඛණ්ඩව වර්ධනය වීම. ● වෙළෙඳපොළ කොටස පුළුල් වීම. ● කර්මාන්ත තුළ විශිෂ්ටයින් බවට පත් වීම. (නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 02)

ආ) ● අවදානම් දැරීමට ඇති කැමැත්ත. ● නිර්මාණශීලී බව. ● කැපවීම. ● ආත්ම විශ්වාසය. ● ස්වාධීන බව. (නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 02)

(v) මිනිස් අවශ්‍යතා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා අවදානම් කළමණාකරණය, තීරණය ගැනීම හා නව්‍යතා සම්පාදනය සිදු කරමින් අනෙකුත් නිෂ්පාදන සාධන සංයෝජනය කර ව්‍යාපාර ආරම්භ කර පවත්වාගෙන යාම ව්‍යවසායකත්වයයි. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා ඕනෑම ආර්ථික කටයුත්තක් ව්‍යාපාරයකි.

මේ අනුව ව්‍යවසායකත්වය තුලින් ව්‍යාපාර බිහි වුවද සියළුම ව්‍යාපාර ව්‍යවසායන් නොවේ. ඊට හේතුව ව්‍යාපාර වලට සාපේක්ෂව ව්‍යවසායකයන් විසින් ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම, අවදානම් කළමණාකරණය, හා නව්‍යතා සම්පාදනය යන කටයුතු වලද නිරත වීමයි.

එම නිසා සියළු ව්‍යවසායන් ව්‍යාපාර වන නමුත් සියළු ව්‍යාපාර ව්‍යවසායන් නොවේ.

(නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 04)

II කොටස

05. (i) අ) ස්වාධීනව අයිති හා ස්වාධීනව ක්‍රියාත්මක වන එසේම ක්ෂේත්‍රය තුල බලයන් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ. (ල. 02)

ආ) ● ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායක වීම. ● දේශීය සම්පත් භාවිතා කිරීම. ● ආදායම් ව්‍යාප්ති විෂමතා අවම වීම. ● මෙම ව්‍යාපාර බොහෝ දුරට ශ්‍රම සූක්ෂම කර්මාන්ත වන නිසා වැඩි සේවා නියුක්තියට දායක වීම. ● මහා පරිමාණ ව්‍යාපාර වලට අවශ්‍ය අමුද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය ලබා දීම. ● ප්‍රාදේශීය සංවර්ධනය හේතුවෙන් නාගරිකකරණය නිසා ඇතිවන ගැටළු අවම වීම. ● මහා පරිමාණ ව්‍යාපාර ඉටු නොකරන ඇතැම් ආර්ථික කටයුතු සිදු කිරීම. (කරුණු 04 ට ලකුණු 02)

(ii) අ) ● මූල්‍යමය ගැටළු ● කළමණාකරණ දුර්වලතා ● ව්‍යවසායකත්ව හැකියා අඩු වීම. ● වෙළඳපල තරඟකාරිත්වයට මුහුණ දීම අපහසු වීම. ● යටතල පහසුකම් ප්‍රමාණවත් නොවීම. ● නව තාක්ෂණික දැනුම අඩු කම හා නව තාක්ෂණය යොදා නොගැනීම. (කරුණු 04 ට ලකුණු 02)

ආ) ● උපදේශන සේවා. ● ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන්. ● පර්යේෂණ හා තාක්ෂණික සේවා. ● යටිතල පහසුකම් සැපයීම. ● වෙළඳපොල පහසුකම් සැපයීම. ● විශිෂ්ටතා සම්මාන ලබාදීම.

(කරුණු 04 ට ලකුණු 02)

(iii) අ)

ඉතුරුම් තැන්පතු	ඉල්ලුම් තැන්පතු
1. පාස්පොත් හිමි වේ.	1. චෙක්පොතක් ලැබේ.
2. චෙක්පත් නිකුත් කළ නොහැකිය.	2. චෙක්පත් නිකුත් කිරීමට අවසර ඇත.
3. ශේෂය මත පොලියක් හිමි වේ.	3. ශේෂයට පොලියක් හිමි නොවේ.

4. වානිජ බැංකු මෙන්ම අනෙකුත් මූල්‍ය ආයතන ද ගිණුම් පවත්වාගෙන යයි. 4. වාණිජ බැංකුවලට පමණක් ගිණුම් භාර ගැනීමට අවසර ඇත.

(කරුණු 04 කට ලකුණු 02 වෙනත් පිළිගත හැකි කරුණු ඇත්නම් ලකුණු දෙන්න.)

ආ) 1. කුලිපිට ගැනුම් පහසුකම් සැපයීම. 2. දේපල හා ඉඩම් වෙළඳාම් කිරීම.
3. කල්බදු මූල්‍යකරණය. 4. කෙටිකාලීන ණය සැපයීම.
5. රජයේ සුරැකුම්පත් වල ආයෝජනය. 6. කාලීන තැන්පතු භාර ගැනීම.

(කරුණු 04 ට ලකුණු 02)

(iv) 1. විවිධ ආකර්ෂණීය ණය ක්‍රම හඳුන්වා දීම. 2. විවිධ ආකර්ශනීය ඉතිරි කිරීමේ ගිනුම් හඳුන්වා දීම.
3. බැංකු සේවා පුළුල් කිරීම හා කුඩා බැංකු ඇරඹීම. 4. භාණ්ඩ අලෙවිසැලේ ආරම්භ කිරීම.
5. නව ටෙලර්පත්, ණය පත්, හරපත් හඳුන්වා දීම.
6. රක්‍ෂණ සේවා, කල්බදු සේවා සහ වෛද්‍ය සේවා වැනි විවිධ අංශ වෙත යොමු වීම.
7. ඉලෙක්ට්‍රෝනික මුදල් පැවරුම් ක්‍රම හඳුන්වා දීම. (කරුණු 4 ට ලකුණු 02)

(වෙනත් පිලිගත හැකි කරුණු වලට ලකුණු දෙන්න.)

(v) අ) ⋆ පහසුවෙන් නොමැකෙන තීන්ත වර්ගයක් භාවිතා කිරීම. ⋆ පිලිපතේ අදාල විස්තර සටහන් කර ගැනීම. ⋆ එකම භාෂා මාධ්‍යයක් යොදා ගැනීම. ⋆ අණකරුගේ අත්සන නියමාකාරයෙන් යෙදීම. ⋆ හිස් චෙක්පත් වලට අත්සන් නොයෙදීම. ⋆ චෙක්පතට යොදවා දිනය හා ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම.

(කරුණු 04 ට ල. 02)

ආ) ⋆ වංචනික ක්‍රියා වලට ඇති ඉඩකඩ අවම වීම. ⋆ ගෙවීම් ප්‍රමාද කිරීමට අවස්ථාව ලැබීම. ⋆ ආරක්ෂිත බව ඉහළ වීම. ⋆ කිසියම් වංචනික ක්‍රියාවක දී නීතිමය පියවර ගැනීමට හැකි වීම. ⋆ තැපෑලෙන් යවන චෙක්පත් සඳහා අවසර ආරක්ෂාවක් හිමි වීම. (කරුණු 04 ට ලකුණු 02)

06. (i) අ) ● රාජ්‍ය ණය පාලනය, ● විදේශ විනිමය පාලනය. ● සේවක අර්ථසාධක අරමුදල් පාලනය. ● කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩ සටහන් පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම. (කරුණු 04 ට ලකුණු 02)

ආ) ● කුඩා ඒකක වලට බෙදිය හැකි වීම. ● කල් පැවැත්ම. ● ගෙනයාමේ පහසුකම්. ● පහසුවෙන් හඳුනාගත හැකි වීම / සමජාතිය වීම. ● අනුකරණය අපහසු වීම. ● සුලභ හෝ දුලභ නොවීම.

(කරුණු 04 ට ලකුණු 02)

(ii) අ) 1. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම. 2. වටිනාකම මැනීමේ මිණුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම. 3. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම. 4. විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

(කරුණු 04 ට ලකුණු 02)

ආ) ● ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර. ● ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර. ● චෙක්පත් තැන්පතු යන්ත්‍ර. ● වෙළෙඳ සැල් ගෙවීම් විද්‍යුත් පැවැරුම් ජාල. ● ටෙලි බැංකු පහසුකම්. ● අන්තර්ජාල බැංකු කටයුතු. ● ටෙලිවිෂන් බැංකු පහසුකම්. (කරුණු 04 ට ලකුණු 02)

(iii) අ) ● අවදානම පුරෝකථනය කළ හැකි වීම. ● අනාගතයේ සිදුවිය හැකි අවදානම මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකිවීම. ● අවදානම නියත නොවිය යුතු වීම. ● සම්බන්ධතාවලින් තොරවීම. ● සත්‍යාපනය කළ හැකි වීම. (කරුණු 04 ට ලකුණු 02)

ආ)

රක්‍ෂණය	ආරක්‍ෂණය
● දේපල, වගකීම් පිළිබඳ අයිතිය. සම්බන්ධ රක්‍ෂණයයි.	● ජීවිතය සම්බන්ධ රක්‍ෂණයයි.
● ගෙවූ වාරික ආපසු ලබා ගත නොහැකිය.	● හානියක් සිදු වුවත් නැතත් ගෙවූ වාරික ලබාගත හැකිය.
● ඉතිරි කිරීමකට සමාන නොවේ.	● ඉතිරි කිරීමකට සමාන වේ.
● හානි පූර්න අදාළ වේ.	● හානි පූර්ණය අදාල නොවේ.
● පැවරිය හැකිය.	● පැවරිය නොහැක.

(කරුණු 04 ට ලකුණු 02)

(iv) අ) ● මහජන / පොදු වගකීම් රක්‍ෂණ. ● නිෂ්පාදන වගකීම් රක්‍ෂණ. ● සේවක වගකීම් රක්‍ෂණ. ● දේපල

අයිතිකරුවන්ගේ වගකීම් රක්‍ෂණ.

(මින් 02 ක් නම් කර, පැහැදිලි කිරීමට 1/2 බැගින් ලකුණු 02)

ආ) ● රක්‍ෂණ සමාගම් පෞද්ගලිකරණය වීම. ● නව රක්‍ෂණ ඔප්පු හඳුන්වා දීම. ● වාණිජ බැංකු රක්‍ෂණ ක්ෂේත්‍රයට පිවිසීම. ● වන්දි ගෙවීම කාර්යක්‍ෂම කිරීම. ● රක්‍ෂිතයන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම.

(කරුණු 04 ට ලකුණු 02)

(v) අ) ● පණිවිඩය හුවමාරුවන භූමි ප්‍රදේශය. ● යොදා ගන්නා මාධ්‍ය. ● සම්බන්ධවන පාර්ශව. ● පණිවිඩය ගලායන දිශාව. ● සංවිධාන ව්‍යුහය. ● භාවිතා කරන තාක්‍ෂණය. (ලකුණු 02)

ආ) ● ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම් දක්වා උපදෙස් දැනුම හා අවබෝධය ලබා දීමට හැකිවීම. ● ආයතනයේ සේවකයින්ට තම අදහස් ප්‍රකාශ කිරීමට හැකිවීම. ● සේවකියන් අභිප්‍රේරණය වීම හා කණ්ඩයම් වැඩ පහසු වීම. ● තීරණ ගැනීම පහසු වීම. ● ගැටුම් විසදා ගැනීමට පහසු වීම. ● සම්බන්ධීකරණය පහසු වීම. (ලකුණු 02)

07. (i) අ) ● යවන්නා. ● ආකේතකරණය. ● පණිවුඩය. ● මාධ්‍ය. ● විකේතනය. ● ලබන්නා. ● ප්‍රතිචාරය. ● ප්‍රතිපෝෂණය. ● බාධා.

ආ) පණිවුඩයක තිබිය යුතු මූලික ගුණාංග ඇතුළත්, ග්‍රාහකයාගෙන් ක්‍ෂණිකව ප්‍රතිචාරයක් අපේක්‍ෂා කළ අයුරින් ලබා ගත හැකි සන්නිවේදන බාධා වලින් තොර සන්නිවේදනයයි. (ල. 02)

(ii) අ) ● නිවැරදි බව. ● සංක්‍ෂිප්ත බව. ● පූර්ණ බව. ● පැහැදිලි බව. ● ආචාරශීලී බව, ● නිශ්චිත බව. ● පිරිවැය අඩු2 බව. ● වේග. ● රහස්‍ය බව. ● ආරක්‍ෂාව. (ල. 02)

ආ) ● විද්‍යුත් තැපැල. ● ජංගම දුරකථනය. ● එක්ස්ට්‍රානෙට්. ● ඉන්ට්‍රානෙට්. ● අන්තර්ජාලය. ● වීඩියෝ සම්මන්ත්‍රණ. ● හඬ තැපැල. ● ඉන්ටර්කොම්බ්. (ල. 02)

(iv) අ) ● භාණ්ඩ භාර දිය යුතු ස්ථානය වෙත ළගා විය හැකි කෙටිම මාර්ගය හඳුනා ගැනීමට හැකි වීම.

● භාණ්ඩ භාර දිය යුතු ස්ථානයට ඇති දුර හා ඒ සඳහා ගත වන කාලය දැන ගත හැකි වීම.

● භාණ්ඩ බෙදා හැරීම සඳහා වූ ප්‍රවාහන පිරිවැය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වීම හා ඒ අනුව ගාස්තු නියම කිරීමට පහසු වීම. ● භාණ්ඩ භාරදිය යුතු අදාළ ස්ථානයන්හි පිහිටීම පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වීම. හා ඒ අනුව ගාස්තු නියම කිරීමට පහසු වීම. ● භාණ්ඩ භාර දිය යුතු අදාළ ස්ථානයන් හි පිහිටීම පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි වීම. (ල. 02)

ආ) ● තොග ලැබීම. ● හඳුනා ගැනීම. ● පරීක්‍ෂා කිරීම. ● නිවැරදි බව තහවුරු කර ගැනම. ● ගුණත්වය ආරක්‍ෂා කිරීම. ● පසෙකින් තැබීම. / ඉවතින් තැබීම. / ඉවත් කිරීම. ● නිකුත් කිරීම සඳහා නැවත ලබා ගැනීම. (ල. 02)

(iv) අ) ● ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම හා ඉඩකඩ. ● ද්‍රව්‍ය භාවිතයේ වේගවත් බව හා ගබඩාව තුළ කලාප වෙන් කිරීමේ අවශ්‍යතාව. ● ප්‍රධාන සම්බන්ධතාවලට ආසන්න බව. ● ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ හැකියාව. ● ගබඩාකරණ ද්‍රව්‍යයේ ස්වභාවය. ● දැරීමට සිදුවන පිරිවැය. (ල. 02)

ආ) ● ෆෝක් ලිප්ට්. ● පැලට් ජැක්ස්. ● භාණ්ඩ එහා මෙහා කිරීමේ පටි, ● ෆෝක්ලිෆ්ට් ට්‍රක්. (ල. 02)

(v) 1. නිෂ්පාදිත අඛණ්ඩව වෙලඳපොලට සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනාගත හැකි වීම.

2. සියලුම කාර්යයන් සැලසුම් සහගතව සිදු කිරීම නිසා නාස්තිය හා අපනය අවම වීම තුළින් පිරිවැය අවම කර ගත හැකි වීම.

3. තරගකාරීත්වයට ශක්තිමත්ව මුහුණ දීමට හැකි වීම.

4. යන්ත්‍ර සූත්‍ර, සේවකයින් වෙනුවෙන් දැරීමට සිදුවන අක්‍රීය පිරිවැය අවම කරගත හැකි වීම.

5. නිෂ්පාදිත වල ගුණත්වය ආරක්‍ෂාකර ගත හැකිවීම.

6. අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදු වීමක් ගැටලු මතු නොවීම.

7. කර්මාන්තය තුළ නායකයා බවට පත් විය හැකි වීම. (ල. 02)

08. (i) අ) ● අන්තර්ජාලය - වෙළඳ දූතයන් මගින්. ● විදේහ වෙළඳ නාමාවලිය - විදේශීය තානාපති කාර්යාල

තොරතුරු. ● වෙළඳ හා නාවික තොරතුරු සේවාව - පෞද්ගලික - සම්බන්ධකම්. ● අන්තර්ජාල වෙළෙඳපලවල් හා ප්‍රදර්ශනය - ලෝක වෙළඳ මධ්‍යස්ථාන තොරතුරු. ● වාණිජ මණ්ඩල තොරතුරු - විදේශීය සඟරා හා පුවත්. (ල. 02)

ආ) ● අන්තර්ජාල පහසුකම් සෑම ප්‍රදේශයකම ව්‍යාප්ත නොවීම. ● ව්‍යාපාරය පිළිබඳ පාරිභෝගිකයන්ගේ දැනුම මදිකම. ● ගෙවීම් ක්‍රම වල පවතින ගැටලු. ● බදු අය කිරිම වැනි නීතිමය සීමා. ● ගෙවීම් ක්‍රම පිලිබඳ එක් මාධ්‍යයක් නොමැති කම. ● පරිගණක පද්ධති ආශ්‍රිතව වංචා හා දූෂණ සිදුවීම.

(ii) අ) ● විද්‍යුත් සිල්ලර වෙළඳාම - වෙබ් අඩවි හරහ භාණ්ඩ අලෙවය. ● කැටලොන් මගින් වෙළඳාම - රූපලාවන්‍යයට අදාල භාණ්ඩ. ● සෘජු අලෙවිය - ගුවන් යානා, නැව්. ● රූපවාහිනි නාලිකා මගින් - ව්‍යායාම උපකරණ ඖෂධ වර්ග. ● ජංගම රථ මගින් අලෙවිය - බේකරි නිෂ්පාදනය, මාළු, වතුර. ● තැපැල් මගින් අලෙවිය - පොත් පත්, සඟරා. (ල. 02)

ආ) වාසි :- ● නිෂ්පාදිත බෙදාහැරීම සාර්ථක වීම. ● තම භාණ්ඩ හඳුන්වා දීම පහසුවීම. ● වෙළඳපල තොරතුරු පහසුවෙන් ලබාගත හැකි වීම. ● සිය අවදානම් වෙනත් පාර්ශවයකට පැවරිය හැකි වීම.

අවාසිඃ - ● අතරමැදියන් සිදු කරනු ලබන වංචනික ක්‍රියා නිසා ඇතිවන තත්ත්වයන්. ● තම නිෂ්පාදනවල මිල ගණන් ඉහළ යාමට ඇති ඉඩකඩ වැඩි වේ. ● වෙළඳපොල අහිමි වීය හැක. ● මුදල් නියමිත වේලාවට නොලැබීම නිසා ඇති වන තත්වයන්. ● භාණ්ඩ යල් පැනීම හා නශ්‍යවීමේ අවදානමට ලක්වීම.(ල. 02)

(iii) අ) ● වඩාත් කාර්යක්ෂම නිෂ්පාදන ව්‍යුහයන් ඇති කර ගැනීම. ● සෘජු විදේශ ආයෝජන වැඩි වශයෙන් ලබා ගැනීම. ● දේශපාලන සබඳතා වර්ධනය කර ගැනීම. ● කලාපීය සහයෝගීතාව හා සුහදතාවය වර්ධනය වීම, ● තරඟකාරීත්වය අඩුකර ගැනීමට. (ල. 02)

ආ) (a)නව අන්තර්ජාතික මූල්‍ය ක්‍රමයක් ආරම්භ කරනු වස් ඇමරිකාවේ දී 1947 දී පිහිටුවනු ලැබූවකි. මෙම සාමාජික රටවල් 15 ක් වන අතර සාමාජික රටවල් ගෙවනු ලබන සාමාජික මුදලින් අරමුදල ගොඩනැගී ඇති රටකට දෙනු ලබන ණය ප්‍රමාණය තීරණය කිරීමේ දී එම රට දායක වන මුදල් ප්‍රමාණය සලකා බලයි. විශේෂයෙන්ම සාමාජික රටවල් කෙටි කාලීන ගෙවුම් ශේෂ හිඟයක් පියවා ගැනීම මෙම ණය මුදල් යොදා ගනී.

(b)ලෝකයේ ප්‍රධාන වෙළඳ හවුල් වලට සම්බන්ධ රටවල් 08 ක් විසින් පිහිටුවා ගෙන ඇති ජාත්‍යන්තර සංසදය මෙය වේ. කැනඩාව, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, රුසියාව, ජපානය,එක්සත් රාජධානිය, ඇමරිකාව මෙහි සාමාජිකත්වය දරයි.

(c)අපනයන සංවර්ධන ප්‍රවර්ධන හා සංවර්ධනය, සම්බන්ධ කටයුතු කරන පාරිභෝගික හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යයි. මෙම ආයතනය ඉටු කරන කාර්යයන් අපනයනයට හිතකර පරිසරයක් ඇති කිරීම. අපනයන ආශ්‍රිතව නිෂ්පාදන වාත්තීය සේවා පුළුල් කිරීමට කටයුතු කිරීම, අපද්‍රව්‍ය නිපදවන්නන්ට හා වෘත්තීය සේවා සපයන අයට අවශ්‍ය විශේෂඥ සේවා සැපයීම.

(d)මුදල අමත්‍යාංශය යටතේ පවතින මෙය ප්‍රධාන රේගු කොමසාරිස්වරයෙකු යටතේ කටයුතු කරයි. මෙම දෙපාර්තමේන්තුවේ උප ඒකක ගුවන් තොටුපලවල, වරායවල, බදු නිදහස් වෙළෙඳ සංකීර්ණවල හා මුහුදු හා ගුවන් පාර්සල් මෙහෙයුම් කාර්යාලවල පවත්වාගෙන යයි. (ල. 02)

(iv) අ) ● අපනයන බලපත්‍ර ලබා ගැනීම. ● නැව් ඉඩකඩ වෙන් කර ගැනීම හා අවශ්‍ය ලියවිලි සකස් කර ගැනීම. ● භාණ්ඩ ඇසුරුම් කිරීම. ● භාණ්ඩ රක්ෂණය කිරීම. ● භාණ්ඩ නැව්ගත කර නෞභාරපත ඇතුළු ලියවිලි ලබා ගැනීම. ● මුදල් ලබා ගැනීමට අදාළ කටයුතු වල නිරත වීම. (ල. 02)

ආ) ● විද්‍යුත් වාණිජ්‍ය හරහා විදේශ වෙළඳාම ව්‍යාප්ත කිරීම. ● විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය. ● වෙළඳ කලාප හා වෙළඳ හවුල් ඇති වීම. ● වෙළඳ කලාප හා වෙළඳ හවුල් ඇති වීම. ● වෙළඳ ගිවිසුම් හරහා වෙළඳාම සිදුවීම. ● විද්‍යුත් ලියවිලි භාවිතය. ● ජාත්‍යන්තර සංවිධානවල බලපෑම වැඩිවීම. ● ජාත්‍යන්තර සංවිධානවල බලපෑම වැඩි වීම. ● ජාත්‍යන්තර ප්‍රමිති සහ නීතිරීති කෙරෙහි වැඩි නැඹුරුව. (ල. 02)

(v) ● දවසේ ඕනෑම වේලාවක ව්‍යාපාර කටයුතු කළ හැකි වීම. ● ආරම්භක පිරිවැය අඩු වීම. ● ගනුදෙනු වේගවත් වීම. ● වෙළඳපොල පුළුල් වීම. ● මිල මට්ටම සාපේක්ෂව අඩුවීම / අතරමැදියන් නොමැති වීම. ● භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් පැවතීම. ● ගනුදෙනුවලට අදාළ ක්‍රියාකාරී පිරිවැය අවම වීම. ● නව භාණ්ඩ පරිහරණයට අවස්තාව ලැබීම. ● ලියකියවිලි භාවිතය අඩු වීම. ●ගනුදෙනු සම්පූර්ණයෙන් විනිවිද භාවයෙන් යුක්ත වීම. ● තොග පවත්වාගෙන යාමට අවශ්‍ය නොවීම. ● වැඩි ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය නොවීම. (ල. 02)